## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (සංඛ්‍යාන) නිලධාරීන් සඳහා වන වාර්ෂික ස්ථානමාරු පටිපාටිය

1. **හැඳින්වීම**

   රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2022.12.14 දිනැති අංක 2310/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්ය පටිපාටික රීති 1 වැනි කොටසේ XVIII වැනි පරිච්ඡේදයේ 250 රීතියේ විධිවිධාන අනුව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (සංඛ්‍යාන) නිලධාරීන් සඳහා වන වාර්ෂික ස්ථානමාරු පටිපාටිය.

2. **වාර්ෂික ස්ථානමාරු සඳහා යටත්වන නිලධාරීන් පිළිබඳ විස්තර:**

   ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවෙහි,

   i. ප්‍රධාන කාර්යාලය,
   ii. දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන කාර්යාල,
   iii. පළාත් සභා කාර්යාල,
   iv. සියළුම අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු හා රාජ්‍ය ආයතනයන්හි සේවයේ නියුතු සියලුම නියෝජ්‍ය අධ්‍යක්ෂ (සංඛ්‍යාන) නිලධාරීන්

3. **සේවා ස්ථාන වර්ගීකරණය:**

   සියලුම සංඛ්‍යාලේඛන කාර්යාල “ඉතා ප්‍රියමනාප” “ප්‍රියමනාප” සහ “ප්‍රියමනාප නොවන” සේවා ස්ථාන වශයෙන් වර්ග කෙරේ.

3.1 **ප්‍රියමනාප නොවන සේවා ස්ථාන**

   පහත සඳහන් දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන කාර්යාල “ප්‍රියමනාප නොවන” සේවා ස්ථාන සේ සලකනු ලබයි.

   i. මොණරාගල දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන කාර්යාලය
   ii. නුවරඑළිය දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන කාර්යාලය
   iii. කිළිනොච්චිය දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන කාර්යාලය
   iv. මුලතිව් දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන කාර්යාලය
   v. වවුනියාව දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන කාර්යාලය
   vi. මන්නාරම දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන කාර්යාලය
   vii. අනුරාධපුර දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන කාර්යාලය
   viii. පොළොන්නරුව දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන කාර්යාලය
   ix. බදුල්ල දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන කාර්යාලය
   x. පුත්තලම දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන කාර්යාලය
   xi. හම්බන්තොට දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන කාර්යාලය
   xii. මඩකලපුව දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන කාර්යාලය
   xiii. අම්පාර දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන කාර්යාලය
   xiv. ත්‍රිකුණාමලය දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන කාර්යාලය

❖ සටහන: එසේ වුවද යම් නිලධරයෙකු සම්බන්ධයෙන් ප්‍රියමනාප නොවන සේවා ස්ථාන ලෙස සලකා බැලීමේදී 3:2:2 වගන්තියේ සඳහන් විධිවිධානයන්ට යටත්ව, එම සේවා ස්ථාන පිළිබඳව සලකා බලනු ඇත.

3.2 **ඉතා ප්‍රියමනාප සහ ප්‍රියමනාප සේවා ස්ථාන**

   යම් සේවා ස්ථානයක සේවය කිරීම හේතුවෙන් නිලධාරියෙකුට කිසියම් මූල්‍යමය ප්‍රතිලාභයක් හිමිවන සේවා ස්ථාන “ඉතා ප්‍රියමනාප සේවා ස්ථාන” වශයෙන් සහ මූල්‍ය නොවන ප්‍රතිලාභයක් හිමිවන සේවා ස්ථාන “ප්‍රියමනාප සේවා ස්ථාන” වශයෙන් සලකනු ලැබේ. එවැනි සේවා ස්ථාන ලෙස පහත සඳහන් සේවා ස්ථාන ප්‍රමුඛතාව අනුව හඳුනාගෙන තිබෙන අතර අවස්ථානුකූලව එසේ හඳුනාගනු ලබන නව සේවා ස්ථාන අදාල වර්ෂයේ ස්ථානමාරු කැඳවීමේ නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරනු ඇත.

   i. ශ්‍රී ලංකා රේගුව



nq

3.2.1 ප්‍රධාන කාර්යාලයේ සියළුම අංශ ප්‍රියමනාප සේවා ස්ථාන ලෙස සලකනු ඇත.

3.2.2 නිලධාරියා පදිංචි දිස්ත්‍රික්කය තුල පිහිටි සේවා ස්ථානය එම නිලධාරියා සඳහා ප්‍රියමනාප සේවා ස්ථානයක් ලෙස සලකනු ලැබේ.

## 4. ස්ථානමාරුවීම් වලට අදාල මූලික කරුණු

I. ස්ථාන මාරු ලබා දීමේ දී,

   i. දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන කාර්යාල (ක්ෂේත්‍රය)
   ii. ප්‍රධාන කාර්යාලයේ තිබෙන අංශ
   iii. මෙම දෙපාර්තමේන්තුවෙන් පරිබාහිරව වෙනත් රාජ්‍ය ආයතන වල පිහිටි සංඛ්‍යාලේඛන අංශ

ලෙස ප්‍රමුඛත්වයට අනුව වර්ගීකරණය කර, පුරප්පාඩු සඳහා නිලධාරීන් අනුයුක්ත කිරීමේදී ඉහත අනුපිළිවෙලට අනුව ප්‍රමුඛත්වය ලබාදෙනු ඇත.

II. ජන හා නිවාස සංගණනය, කෘෂිකර්ම සංගණනය, කර්මාන්ත සංගණනය හෝ වෙනත් විශේෂ සංගණනයක් හෝ සමීක්ෂණයක් (අංශයේ සාමාන්‍ය රාජකාරියක් ලෙස පවත්වන සමීක්ෂණ නොවේ) සඳහා සෘජුවම සම්බන්ධවන අංශයක නිලධාරියෙකු සේවා කාලය සම්පූර්ණ කර තිබෙන අවස්ථාවකදී එම නිලධාරියාගේ කැමැත්ත මත අදාල සංගණනය හෝ සමීක්ෂණය අවසන් වනතුරු එම අංශයේ තවදුරටත් රඳවා ගැනීමට අංශ ප්‍රධානියා නිර්දේශ කරන්නේ නම් ඒ පිළිබඳව වාර්ෂික ස්ථාන මාරු කමිටුව මඟින් සලකා බලනු ලැබේ. එහෙත් එවැනි නිලධාරීන්ද ස්ථාන මාරු අයදුම්පත අනිවාර්යයෙන් ඉදිරිපත් කල යුතුය. එතෙකුදු වුවත් ඉතා ප්‍රියමනාප හා ප්‍රියමනාප සේවා ස්ථානවල සේවය කරනු ලබන නිලධාරීන් සම්බන්ධයෙන් එම සේවා ස්ථානවල සම්පූර්ණ කළ යුතු සේවා කාලය සම්බන්ධයෙන් වන විධිවිධානවලට යටත්ව සලකා බැලිය යුතුය.

## 5. සම්පූර්ණ කල යුතු සේවා කාලය:

I. සාමාන්‍යයෙන් ඉතා ප්‍රියමනාප සේවා ස්ථානයක උපරිම සේවා කාලය වසර 03කුත්, ප්‍රියමනාප සේවා ස්ථානයක උපරිම සේවා කාලය වසර 04 කුත්, ප්‍රියමනාප නොවන සේවා ස්ථානවල වසර 02 කුත්, දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශය ප්‍රියමනාප කාර්යාලයක් ලෙස හඳුනාගෙන තිබේ නම් වසර 04 කුත් එසේ නොමැතිනම් වසර 02 කුත් වේ. ප්‍රියමනාප සේවා ස්ථානයක් සඳහා අදාල වර්ෂයේ වෙනත් ඉල්ලුම් කරුවන් නොමැතිවීම නිසා හැරෙන්නට සේවා කාලය වසර 04 කට වැඩියෙන් දීර්ඝ නොකරනු ලැබේ.

II. නිලධාරියා සිය කැමැත්තෙන් තවදුරටත් එම සේවා ස්ථානයේ සේවය කිරීමට ඉදිරිපත් වන අවස්ථාවන්හිදී හැර ප්‍රියමනාප නොවන සේවා ස්ථානයන්හි වසර 02 කට වැඩියෙන් සේවය කරන ලද නිලධාරීන්ට ප්‍රමුඛතා පදනමක් යටතේ ස්ථාන මාරු ලබා දීමට වාර්ෂික ස්ථාන මාරු කමිටුව සලකා බලනු ලැබේ.

III. නියමිත සේවා කාලය සම්පූර්ණ කර ඇති, එහෙත් වාර්ෂික ස්ථානමාරු සඳහා ඉල්ලුම්පත් ඉදිරිපත් කර නොමැති අවස්ථාවකදී හෝ ස්ථානමාරු ඉල්ලුම්පත්‍රයෙහි මනාප තුනම සඳහන් කර නොමැති අවස්ථාවකදී එම නිලධාරීන්ට වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ අභිමතය පරිදි පුරප්පාඩු වන වෙනත් සේවා ස්ථාන සඳහා ස්ථාන මාරුවීම් ලබා දෙනු ලැබේ.

IV. යම් සේවා ස්ථානයක උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් ඉල්ලුම් පත්‍රයේ ඉල්ලා ඇති ස්ථාන තුනම ලබා දීමට නොහැකි අවස්ථාවලදී ස්ථානමාරු කමිටුව ඒ සඳහා අවසන් තීරණය ගනු ඇත.

6. **ප්‍රධාන කාර්යාලය සහ ඉන් බැහැර පිහිටි සියලුම ශාඛා කාර්යාල (අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා හා වෙනත් රාජ්‍ය ආයතන හා දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන කාර්යාල) සඳහා ස්ථාන මාරු කිරීම.**

I. සේවා ස්ථාන පුරප්පාඩු කිරීමේදී සියලුම නිලධාරීන්ගේ සේවා කාලය දෙසැම්බර් 31 දිනට ගණනය කරනු ලැබේ.

II. ස්ථානමාරු කිරීමේදී එක් සේවා ස්ථානයක වසර 04ක් (ප්‍රධාන කාර්යාලය තුළ වසර 04 ගණනය කිරීමේදී ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ සියලුම අංශවල අඛණ්ඩ සේවා කාලය මත පදනම්ව ගණනය කිරීම කළ යුතුය.) හෝ ඊට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන්ට ස්ථානමාරුවීම් සඳහා ඉල්ලුම් කළ හැකිය. එමෙන්ම, අනෙකුත් අංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා හා අමාත්‍යාංශවල වසර 04ක සේවයක් ඇති සියලුම නිලධාරීන් ස්ථාන මාරු වීමකට යටත් වන්නේය. (ඉතා ප්‍රියමනාප සේවා ස්ථාන සඳහා මෙම කාල පරිච්ඡේදය වසර 03 කි).

7. **ඉතා ප්‍රියමනාප සේවා ස්ථාන සඳහා නිලධාරීන් තෝරා ගැනීම**

I. ප්‍රියමනාප නොවන සේවා ස්ථානයකට ස්ථාන මාරුවීම් ලබා නියමිත සේවා කාලය සම්පූර්ණ කර ඇති නිලධරයෙකුට එම සේවා කාලය සඳහා වසරකට ලකුණු 05 බැගින් උපරිම වසර 8ක් සඳහා ලකුණු 40ක් හිමි වේ.

II. නියෝජ්‍ය අධ්‍යක්ෂ (සංඛ්‍යාන) ලෙස සක්‍රිය සේවයේ යෙදී සිටි එක් වසරකට (ඉහත 7.I හි සේවා කාලය හැර) ලකුණු හතරක් බැගින් උපරිම ලකුණු 40 ක් ලබාදෙනු ඇත.

III. ඉල්ලුම් කරන නිලධාරීන් කිසිදු විදේශ වැඩමුළුවකට සහභාගි වී නොමැති නම් ලකුණු 20 ක් ලබා දෙන අතර මෙම දෙපාර්තමේන්තුව මඟින් හෝ මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු ලෙස සේවය කිරීම හේතුවෙන් මෙම දෙපාර්තමේන්තුවෙන් පරිබාහිර වෙනත් සේවා ස්ථානයක් මඟින් විදේශ පුහුණු වීම් ලබා දී තිබේ නම් එවැනි එක් වැඩමුළුවක් සඳහා ලකුණු 4 බැගින් උපරිම වැඩමුළු 5 ක් සඳහා ලකුණු අඩු කරනු ලැබේ.(උපරිම ලකුණු 20ක් අඩු කරනු ලැබේ.)

IV. මෙහි දී ඉතා ප්‍රියමනාප සේවා ස්ථානයක සේවා කාලය වසර 3ක් වුවත් විශේෂ පුහුණුවක් සඳහා හෝ දෙපාර්තමේන්තුවට අදාල වූ වෙනත් විශේෂ කාර්යයක් සඳහා වසර 2 සම්පූර්ණ වීමට පෙර කැඳවා තිබෙන අවස්ථාවකදී එම නිලධාරියාට සම්පූර්ණ කිරීමට ඉතිරිව තිබූ කාල පරිච්ඡේදය මාස 3 කට අඩු නම් එම නියමිත කාල පරිච්ඡේදය සම්පූර්ණ කළා සේ සලකනු ඇත.

V. නිලධාරීන් කිහිප දෙනෙකු ඉල්ලා සිටින අවස්ථාවකදී නිලධාරීන්ගේ ලකුණු සමාන වේ නම් ජ්‍යෙෂ්ඨත්වයට ප්‍රමුඛත්වය ලබා දෙනු ඇත.

VI. ඉතා ප්‍රියමනාප සේවා ස්ථානයක දෙවන වරට සේවා කිරීමට අවස්ථාව හිමි වනුයේ පළමුවරට ඉල්ලුම් කළ නිලධාරීන් නොමැති අවස්ථාවලදී පමණි. එසේම ප්‍රතිලාභ සහිත සේවා ස්ථානයෙන් පිටතට ගොස් වසර 15ක් ගෙවී ඇත්නම් පමණි. එතෙකුදු වුවත් කිසිදු නිලධාරියෙක් අදාල සුදුසුකම් සපුරා නොමැති අවස්ථාවක ඒ පිළිබඳව අවසන් තීරණය වාර්ෂික ස්ථාන මාරු කමිටු තීරණ මත අධ්‍යක්ෂ ජනරාල් විසින් ගනු ඇත.

VII. ඉතා ප්‍රියමනාප සේවා ස්ථානයක නියමිත සේවා කාලය සම්පූර්ණ කරන නිලධාරියෙකු අධ්‍යක්ෂ ජනරාල් අනුමැතිය මත වෙනත් ස්ථානයක් වෙත ස්ථාන මාරු කරන අතර, වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාවලිය සිදු නොවන අවස්ථාවකදී නම් ස්ථාන මාරු ලබා දීමට නියමිත දිනට පෙර අදාල ස්ථාන මාරු පටිපාටිය අනුව විශේෂයෙන් ඉල්ලුම්පත් කැඳවා නිලධාරීන් තෝරා ගනු ලැබේ.



nd

| විස්තරය | ලකුණු ලබා දෙන ආකාරය | උපරිම ලකුණු |
|---|---|---|
| අ. ප්‍රියමනාප නොවන සේවා ස්ථානයකට මාරුවීම් ලබා නියමිත සේවා කාලය සම්පූර්ණ කර ඇති නිලධාරියකුට එම සේවා කාලය සඳහා | වසර 01ක් සඳහා ලකුණු 05 බැගින් උපරිම වසර 8ක් සඳහා | 40 |
| ආ. ඉහත "අ" හි සඳහන් සේවා කාලය හැර නිලධාරියාගේ විධායක සේවා ගණයේ සක්‍රීය සේවා කාලය සඳහා | වසරක් සඳහා ලකුණු 04 බැගින් | 40 |
| ඇ. විදේශ වැඩමුළුවකට සහභාගී වී නොමැති වීම | (ලබාගෙන ඇති විදේශ පුහුණුවීම් වැඩමුළුවක් සඳහා ලකුණු 04 බැගින් උපරිම ලකුණු 20ක් අඩු කරනු ලැබේ) | 20 |
| එකතුව | | 100 |

8. **වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ සංයුතිය, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති හි 250 (III) වගන්තිය ප්‍රකාරව විය යුතුය.**

9. **වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුවේ සංයුතිය, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති හි 254 (II) වගන්තිය ප්‍රකාරව විය යුතුය.**

10. **වාර්ෂික ස්ථානමාරු ලබා දීමේදී සැලකිල්ලට ගන්නා වෙනත් පොදු කරුණු**

10.1 ප්‍රසූති නිවාඩු අවසන් වී නැවත සේවයට පැමිණෙන නිලධාරිනියන්ගේ සේවා ස්ථානය පුරප්පාඩු වී ඇති විටකදී, නිලධාරිනියගේ කැමැත්ත පරිදි තවත් වසරකින් එම සේවා ස්ථානයේම සේවය දීර්ඝ කර ගත හැක. (අදාල ප්‍රසූති නිවාඩු කාලයට සමාන කාලයකින්)

10.2 අවුරුදු 59ක් ඉක්ම වූ නිලධරයන් ඔවුන්ගේ ඉල්ලීමක් නොවන කල්හි දිස්ත්‍රික්ක තුළ වුව ද ස්ථාන මාරු නොකළ යුතුය. (ප්‍රතිලාභ සහිත සේවා ස්ථාන සඳහා මෙම කොන්දේසිය අදාල නොවේ, එහෙත් අනිවාර්ය විශ්‍රාම යාමේ වයස අවුරුදු 60 ලෙස සලකන කල්හි නිලධරයන්ගේ වයස අවුරුදු 59 මාස 6 පසු වී ඇත්නම් ඉතිරි කාලය අදාල ඉතා ප්‍රියමනාප සේවා ස්ථානයේම සේවය කිරීමට සැලැස්විය යුතු අතර එවැනි නිලධරයෙකු ඉල්ලීමක් කළහොත් ඒ සඳහා ප්‍රමුඛතාවය ලබා දීමට අවස්ථානුකූලව සලකා බැලීමට ස්ථාන මාරු කමිටුව කටයුතු කළ යුතු ය. )

11. **වාර්ෂික ස්ථානමාරු කාල සටහන**

| | කාර්යය | දිනය |
|---|---|---|
| 1 | වාර්ෂික ස්ථාන මාරු කමිටුව පිහිටුවීම | ජූනි මස 01වන දිනට පෙර |
| 2 | වාර්ෂික ස්ථාන මාරු දැන්වීම් නිකුත් කිරීම | ජූනි මස 30 වන දිනට පෙර |
| 3 | සම්පූර්ණ කරන ලද වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍ර අදාල බලධාරියා වෙත ඉදිරිපත් කිරීම | ජූලි මස 31 වන දින හෝ එදිනට පෙර |
| 4 | අදාල බලධාරියා විසින් අයදුම්පත්‍ර ස්ථාන මාරු කමිටුවට භාර දීම | අගෝස්තු 10 වැනි දිනට පෙර |
| 5 | වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ ස්ථාන මාරු යෝජනා අදාල බලධාරියා වෙත ලිඛිතව භාර දීම | අගෝස්තු 31 වන දිනට පෙර |
| 6 | යෝජිත වාර්ෂික ස්ථාන මාරු පිළිබඳ දැන්වීම් නිකුත් කිරීම සහ වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු පත් කිරීම | සැප්තැම්බර් මස 15 වන දිනට පෙර |
| 7 | ස්ථාන මාරු වීම් පිළිබඳ සමාලෝචන කමිටු සඳහා අභියාචන භාර ගැනීමේ අවසන් දිනය | සැප්තැම්බර් මස 30 වන දිනට පෙර |
| 8 | වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව විසින් යෝජිත වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් වන තම ලිඛිත නිර්දේශ අදාල බලධාරියා වෙත ලිඛිතව භාර දීම. | ඔක්තෝබර් මස 15 දින හෝ එදිනට පෙර |
| 9 | අවසාන වාර්ෂික ස්ථාන මාරු වීම් නියෝග නිකුත් කිරීම | නොවැම්බර් මස 01 වන දිනට පෙර |
| 10 | වාර්ෂික ස්ථාන මාරු නියෝග බලාත්මක කිරීම | ජනවාරි මස 01 වන දින සිට |

12. **වාර්ෂික ස්ථානමාරු නියෝග වලට විරුද්ධව අභියාචනා ඉදිරිපත් කිරීම පිළිබඳ විස්තර**

12.1 ස්ථාන මාරු කිරීමේ නියෝගයකට එරෙහිව ඉදිරිපත් කරනු ලබන අභියාචනයක්, එම ස්ථාන මාරු කිරීමේ නියෝගය අදාළ රජයේ නිලධාරියා වෙත ලද දින සිට දින 14ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු වන්නේය. නියමිත කාලය තුළ දී ඉදිරිපත් නොවන අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රතික්ෂේප කරනු ලබන්නේය.

12.2 මෙම පරිච්ඡේදයෙහි සඳහන් නියමයන්ට අනුගතව තම අභියාචනා ඉදිරිපත් කිරීම සෑම රජයේ නිලධාරියෙකුගේම වගකීම වන අතර, ඊට පටහැනිව ඉදිරිපත් කරනු ලබන අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සලකා බලනු නොලබන්නේය.

12.3 ඉහත 12.1 වගන්තියේ සඳහන් ලියවිලි ලැබී දින 15ක් ඇතුළත, ස්ථාන මාරු කිරීමේ නියෝගයකට එරෙහිව රජයේ නිලධරයෙකු විසින් ඉදිරිපත් කර ඇති අභියාචනා සම්බන්ධයෙන් තීරණයක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ඇත්තේය.

12.4 ඉහත සඳහන් පරිදි ඉදිරිපත් කර ඇති අභියාචනයක් සම්බන්ධයෙන් වන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය සෘජුවම අභියාචක වෙත දන්වනු ලබන අතර, අදාළ ලිපිගොනු යථාවත් කර ගැනීම සඳහා එහි පිටපත් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් හා දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත යවනු ලබන්නේය.

12.5 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගයකින් හෝ අතෘප්තියට පත්වන රජයේ නිලධරයෙකුට 2002 අංක 04 දරණ පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාර පනතේ සඳහන් විධිවිධාන වලට අනුකූලව පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරයට අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම ඇත්තේය. එසේ වුවද ඒ සඳහා පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරයේ තීරණය ලැබෙන තෙක් අදාළ ස්ථාන මාරු නියෝගය එලෙසම ක්‍රියාත්මක විය යුතු වන්නේය.

සකස් කළේ:
අත්සන: C.Z
(විෂය භාර කනිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)
නම: එල්. ඕ. චිත්‍රා ජයසිලි, අධ්‍යක්ෂ (පාලන), ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, "සංඛ්‍යාන මන්දිරය", අංක 306/71, පොල්දුව පාර, බත්තරමුල්ල
තනතුර:
දිනය: 2025.10.29

පරීක්ෂා කළේ:
අත්සන: ඩී. එස්. පී. විදිරිසිංහ, අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන), ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, "සංඛ්‍යාන මන්දිරය", අංක. 306/71, පොල්දුව පාර, බත්තරමුල්ල.
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)
නම:
තනතුර:
දිනය: 25/10/29

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන: K.M.D.D. Karunaratne
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම: කේ.එම්.ඩී.එස්.ඩී. කරුණාරත්න, අධ්‍යක්ෂ ජනරාල්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, "සංඛ්‍යාන මන්දිරය", අංක 306/71, පොල්දුව පාර, බත්තරමුල්ල.
තනතුර:
දිනය: 2025/11/26

නිල මුද්‍රාව:



29

2025.01.29 හා 2025.07.23 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවෙහි නියෝජ්‍ය අධ්‍යක්ෂ (සංඛ්‍යාන) තනතුර සඳහා වන ස්ථාන මාරු පටිපාටිය සහතික කිරීම සඳහා නිර්දේශ කරමි.

අත්සන:............................

නම:....................................

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

දිනය:....2025/12/23....

නිලමුද්‍රාව: :..................

ඒ. එන්. හපුගල
භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්
මුදල් අමාත්‍යාංශය

යොමු අංකය:..PSC/EST/04-04/01/2024..

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවෙහි නියෝජ්‍ය අධ්‍යක්ෂ (සංඛ්‍යාන) තනතුර සඳහා යෝජිත මෙම ස්ථාන මාරු පටිපාටිය 2025.01.29 හා 2025.07.23 දිනයන්හි රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන:............................

නම:..ඩබ්ලිව්.එම්.එම්.එම්.ඇ.ජේ. දිසානායක..

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය:..2026.01.08..

නිලමුද්‍රාව: :......................

ඩබ්ලිව්.එම්.එම්.එම්.ස.
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන්
අංක 1200/9, රජමල්
බත්තරමු